## රථවාහන නවතා තැබීමේ ස්ථානවල, වාහන නවතා තැබීමේ ගාස්තු අය කිරීමේ ක්‍රියාවලිය

ප්‍රදේශිය සභා සීමාව තුළ වාහන නවතා තැබීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව වැළඳ ගැනීම හෝ සභා අතුරු ව්‍යවස්ථාවක් පනවා ගැනීමට කටයුතු කිරීම

↓

රථවාහන නැවතුම් පොළවල් උපලේඛන සහිතව ප්‍රකාශයට පත්කිරීම

↓

වාර්ෂිකව ගාස්තු සදහා මහ සභාව මගින් විධිමත් සහා සම්මුතියක් ලබාගැනීම

↓

වාර්ෂික බදු පැනවීමේ ගැසට් නිවේදනය මගින් එකී ගාස්තු ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කිරීම

↓

අතුරු ව්‍යවස්ථා මගින් ප්‍රකාශයට පත් කළ රථ වාහන නැවතුම් ස්ථානයක වාහනය නවතා තැබීම

↓

අදාළ වාහනය නවතා තබන ලද වේලාව සටහන් කර ගැනීම

↓

නවතා තබන ලද පැය ගණන හෝ මාසික ක්‍රමය මත ලදුපතක් මගින් ගාස්තු අය කර අවසර පත්‍රයක් නිකුත් කිරීම

## 19.1 හැඳින්වීම

පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ගවල සහ පොදු ස්ථානවල අවිධිමත් ආකාරයෙන් රථ වාහන නවතා තැබීම පාලනය කිරීම සහ එමඟින් මහා මාර්ගයේ ගමන් කරන වාහනවලට සහ පදිකයන්ට ඇති වන අවහිරතා මග හැරවීම මඟින් ජනතාවගේ පහසුව ඇති කිරීම පළාත් පාලන ආයතනයේ යුතුකමකි. පළාත් පාලන ආයතනය විසින් රථ වාහන නවතා තබන ස්ථාන ඇති කර, ඒ ස්ථානයේ රථ වාහන නවතා තැබීමට අවශ්‍ය ඉඩ කඩ වෙන් කර දෙනු ලැබේ. ඒ යම් ස්ථානයක නවතා තබන රථ වාහනවලින් ගාස්තුවක් අය කර ගැනීම මඟින් ඒ ස්ථාන මනාව නඩත්තු කිරීමට අවශ්‍ය වියදම් සපයා ගනු ලැබේ.

## 19.2 නෛතික අධිකාරිය

- ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තියෙන් ලැබී ඇති බලතල යටතේ සාදනු ලැබ 2010/07/16 දැනැති 1663 අංක දරන සම්මත අතුරු ව්‍යවස්ථා.
- ඉහත ගැසට් නිවේදනය මහ සභාව විසින් වැළඳගෙන ප්‍රකාශයට පත්කළ ගැසට් නිවේදනය

## 19.3 ගාස්තුව

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථා අනුව කලින් කල නියම කරනු ලබන ගාස්තුවක් ගෙවිය යුතුය.

## 19.4 කාර්යය පටිපාටිය

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|---|
| 1 | ප්‍රදේශිය සභා සීමාව තුළ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව වැළඳගැනීම සම්බන්ධ විධිමත් සහා සම්මුතිය ගැනීම | අදාළවන අවස්ථාවේදි එක් වරක් පමණි | සභාව |
| 2 | ප්‍රදේශිය සභා සීමාව තුළ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව වැළඳගැනීම සම්බන්ධ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත්කිරීම | අදාළවන අවස්ථාවේදි එක් වරක් පමණි | සභාව මඟින් සභාපති |
| 3 | රථවාහන නැවතුම් පොළවල් උපලේඛන සහිතව ප්‍රකාශයට පත්කිරීම | අදාළවන අවස්ථාවේදි එක් වරක් පමණි | සභාව මඟින් සභාපති |
| 4 | වාර්ෂිකව ගාස්තු සඳහා මහ සභාව මඟින් විධිමත් සහා සම්මුතියක් ලබාගැනීම | වර්ෂයක් එළඹීමට පෙර | මහ සභාව |
| 5 | වාර්ෂික බදු පැනවීමේ ගැසට් නිවේදනය මඟින් එකී ගාස්තු ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කිරීම | බද්ද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වර්ෂයට පෙර වර්ෂයේ දෙසැම්බර් 31හෝ ඊට පෙර | සභාපති/ ලේකම් |

| | | | |
|---|---|---|---|
| 6 | රථ වාහන නැවතුම් පොළක වාහනය නවතා තැබීම | | |
| 7 | ලදුපතක් මගින් නියමිතගාස්තුව අය කර ගැනීම සහඅවසර පත්‍රයක් නිකුත් කිරීම | වාහනය නවතා තබන අවස්ථාවේ දී | රථ වාහන නැවතුම් ස්ථාන පාලක |

සටහන: i. රථ වාහන නවතා තැබීමට වෙන් කළ ස්ථානයක නිරන්තරයෙන් වාහනයක් නතර කර තැබීමට අවශ්‍ය යම් තැනැත්තකුට, ඒ සඳහා මාසිකව ගාස්තුවක් ගෙවීමෙන් ස්ථානය වෙන් කර ගැනීමට ඉඩ දිය හැකිය.

ii. රථ වාහන නවතා තැබීමට වෙන් කරන ලද යම් ස්ථානයක රථ වාහන නවතා තැබීම වෙනුවෙන් මුදල් අය කර ගැනීමට සභාවේ නිලධරයකු යෙදවීම වෙනුවට, ඒ ස්ථානයේ වාහන නවතා තැබීම වෙනුවෙන් වන ගාස්තු අය කර ගැනීම වාර්ෂිකව ටෙන්ඩර කැඳවීම මගින් තෝරා ගත් ටෙන්ඩරකරුවකු වෙත ගිවිසුමකට එළඹීමෙන් පසුව බදු දීම ප්‍රාදේශීය සභාවක් විසින් කළ හැකිය.